**පටිච්චසමුප්පාදය (හතරවෙනි කොටස)**
28.04.2019 - ශ්‍රී ලංකාරාමය
නවසීලන්තය

නමො තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමො තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමො තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

හොඳයි ශ්‍රද්ධාවන්ත පින්වත්නි හැම දෙනාටම තෙරුවන් සරණයි! අපි මේ වෙලාවේදී දානය අරගෙන ඉවර උනාට පස්සේ ධර්ම සාකච්ඡාවක් පවත්වනවා. අදත් පටිච්චසමුප්පාද කාණ්ඩය තමයි කියලා දෙන්න බලාපොරොත්තු වෙන්නේ. ඒ පටිච්චසමුප්පාද ධර්ම කාණ්ඩයේ **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං** කියන කාණ්ඩයත් **විඤ්ඤාණ පච්චයා නාමරූපං** කියන කාණ්ඩයත් හරිම ගාම්භීර තැනක්. අපි ඊයේ දවසෙත් මේ පින්වතුන්ට ධර්ම කොට්ඨාසයක් දේශනා කළා **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං** කියන තැනට සම්බන්ධව.

**සංඛාර** වශයෙන් ඉදිරිපත්වෙන ධර්ම කොටසක් තිබෙනවා, ඒ වගේම **විඤ්ඤාණ** වශයෙන් ඉදිරිපත් වන ධර්ම කොටසක් තිබෙනවා. **කර්ම විඤ්ඤාණය** හඳුන්වපු තැන තමයි **සංඛාර** කියලා කියන්නේ. **විඤ්ඤාණං** කියලා කියන්නේ කර්ම විඤ්ඤාණයේ බලය නිසා පහළ වෙන්නාවූ **ප්‍රතිසන්ධි විඤ්ඤාණ** සහ **ප්‍රවෘත්ති විඤ්ඤාණ.** සංස්කාරයෝ නිසා විඤ්ඤාණයෝ හටගන්නවා කියන තැන හරි අමාරු තැනක්.

බුදුරජාණන් වහන්සේ ආකාර දෙකකට මෙය දේශනා කරලා තිබෙනවා.

- විඤ්ඤාණය මුල් කරගෙන දේශනා කරලා තිබෙනවා.
- අණ්ඩජ - ජලාබුජ - සංසෙදජ - ඕපපාතික කියලා උප්පත්ති වශයෙන් යන පරිසරය අනුව දේශනා කරලා තිබෙනවා.

නමුත් මෙතැන **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං** කියන තැන කියන්නේ සංඛාරයක් නිසා විඤ්ඤාණය හට ගන්නේ කොහොමද කියන එකයි. මෙතැන හරි අමාරුවෙන්නේ මෙන්න මෙහෙමයි.

අපි කියනවා කෙනෙක් මරණයට පත්වෙලා ගිහිල්ලා තිරිසන් ලෝකයේ උපදිනවා කියලා. ඒවාගේම කෙනෙක් මරණයට පත්වෙලා ගිහිල්ලා දිව්‍යලෝකයේ උපදිනවා කියන කථාව කියනවා. සම්මුති වශයෙන් ගත්තහම කෙනෙක් කියලා කියන්නේ, සත්වයෙක් කියලා කියන්නේ නාමයක සහ රූපයක එක්කාසුවක්.

- නාම කියලා කියන්නේ සිත සහ චෛතසික ධර්ම සමූහය.
- රූප කියලා කියන්නේ හිත පවතින්න ආධාර කරන කර්මජ රූප සංඛ්‍යාත මේ ශරීරය.

එතකොට මේ රූප ගොඩයි (ශරීරයයි) ඒකට බැඳී තිබෙන්නා වූ සිතයි (විඤ්ඤාණය) චෛතසික සමූහයයි එකට එක්කාසු වෙලා යම්තරම් කාලයක් පවතිනවා. යම්කිසි කෙනෙක් මිය පරලොව ගිහිල්ලා දිව්‍යලෝකයේ උප්පත්තිය ලැබුවහම අපි කියනවා එයා මෙහෙන් ගිහිල්ලා දිව්‍යලෝකයේ ඉපදුනා කියලා. එයා අත්හැරලා ගිය දේකුත් තිබෙනවා. Continue වෙච්ච දේකුත් තිබෙනවා.

අතහැරලා ගිය දේ තමයි මේ ලෝකයේ ජීවත් වෙලා ඉන්න කාලයේ හිතට නිශ්‍රය වෙලා පැවතිච්ච රූපයක් තිබෙනවා. රූප වශයෙන් මේ ඇඟෙන් අල්ප මාත්‍රයක්වත් මේ ලෝකයේ ඉඳලා එහා ලෝකයට එයා අරගෙන ගිහිල්ලා නෑ. ඒක නිසා රූප සමූහය වශයෙන් මේ ඔක්කෝම ටික මෙහෙ අත්හැරලා දාල තිබෙන්නේ. තව එකක් තමයි මේ ලෝකයේ ඉන්නතාක් කල් මෙයා ලෝකයට ගනුදෙනු කිරීම් වශයෙන් හිතේ තිබෙන message එක දෙන්න වචන සහ ශරීරය ඉදිරපත් කරනවා. දැන් මේ සේනාසනයට මනුස්සයෙක් එනවා කියලා කිව්වහම ඒ එන්නේ හිත පමණක් නොවෙයි, ඇඟ එන්නේ. අපි හිත ආව කියලා නොවෙයි කියන්නේ. ඇවිල්ලා තිබෙන්නේ ශරීරය. දැන් කී දෙනෙක් ඉන්නවද කියලා අපි ගණන් කරලා බලනවා. ගණන් කරලා බලන්නේ ඇඟෙන්. එතකොට මේ කෙනෙක් හැටියට හිටපු මනුස්සයා එහා ලෝකයට ගියා කියලා කියනකොට එයා ගිහිල්ලා තිබෙනවා හැබැයි ශරීරය අතහැරලා දාලා. හැබැයි අපිට කියන්න බෑ මේ මනුස්ස ලෝකයේ හිටපු එක්කෙනාමද කියලා. හේතුව, මේ මනුස්ස ලෝකයේ හිටපු ශරීරයක් හැටියට ඉදිරිපත්වෙලා තිබ්ච්ච ස්වභාවය සම්පූර්ණයෙන්ම දැන් නෑ. ඒක මෙහෙ කුණුවෙලා පුච්චලා වළදාලා සම්පූර්ණයෙන්ම ඉවරයි.

එතකොට මේ ලෝකයෙන් එහා ලෝකයට මොකක්වත් ගියේ නැත්නම් රූප වශයෙන් ගත්තහම එයා නොවෙයි ඒ දිව්‍යලෝකයේ ඉන්නේ. දිව්‍යලෝකයේ තිබෙන්නේ දිව්‍ය ශරීරයක්. ඒක නිසා කියනවා **'නච සො'** කියලා. මෙහෙ හිටපු එක්කෙනා නොවෙයි එහෙ ඉන්නේ.

රූප වශයෙන් මෙහෙන් කිසිම දෙයක් අරන් ගියේ නැතුවට එයාගේ continuation එකක් වෙලා තිබෙනවා. ඒ තමයි මෙහෙ තිබුණ චිත්ත පරම්පරාව, චිත්ත ක්‍රියාවලිය චුතියෙන් ඉවර වෙනකොටම එයාට කර්මානුරූපව ප්‍රතිසන්ධියක් හැදිලා එහෙට දික්ගස්සගෙන යනවා. අපි සංසාරයේ මේ තාක් කල්ම චිත්තක්‍ෂණයකින් චිතක්ෂණයට - චිත්තක්‍ෂණයකින් චිතක්ෂණයට පේළියකට තමයි ඇවිල්ලා තිබෙන්නේ. චිත්තක්ෂණයක් ඇතිවෙනවා නැතිවෙනවා. මේ විදියට දිගටම සිතෙන් සිතට සිතෙන් සිතට බැඳී බැඳී, බැඳී බැඳී තමයි ආවේ.

දැන් අපි ආපස්සට හැරී බැලුවොත්, උදාහරණයක් හැටියට අපි හිතමු අපි ඔක්කෝටම කල්පයක් එහා පැත්තට බලන්න පුළුවන් උනා කියලා. ඒ කල්පය ආපස්සට බැලුවහම අපේ රූප තිබෙන්නේ එක එක හැඩේටයි. මනුස්ස හැඩේට - තිරිසන් හැඩේට - යක්ෂ හැඩේට - භූත හැඩේට - දිව්‍ය හැඩේට - බ්‍රහ්මලෝක ස්වරූපයට ආදී නොයෙක් ආකාරයකට රූප පෙළක් තිබෙනවා. ඊළඟට හිත වශයෙන් බැලුවට පස්සේ එකම වේගයකට පැවතෙන්නාවූ චිත්ත වේගයක්, චිත්ත ක්‍රියා කාරිත්වයත් තිබෙනවා, දම්වැල

වගේ. ඒ චිත්ත පේළිය බලාගෙන ආවහම සමහර චිත්ත කාණ්ඩ තිබෙනවා, ඒවා **කුසල** වෙනවා. සමහර ඒවා **අකුසල** වෙනවා. සමහර ඒවා **විපාක** වෙනවා. සමහර ඒවා **ක්‍රියා** වෙනවා.

සමහර ඒවා තිබෙනවා කර්ම සිත්. ඒවායෙන් සමහරක් අකුසල කර්ම සිත්. සමහර ඒවා තිබෙනවා කුසල කර්ම වෙන ඒවා. සමහර ඒවා තිබෙනවා ධ්‍යාන සිත්. අන්න ඒ වගේ සිත් පේළියක් තමයි දැන් අපිට තිබෙන්නේ.

මේ ලෝකයේ ඉඳලා මනුස්සයෙක් මැරිලා ගිහිල්ලා දිව්‍ය ලෝකයේ ඉපදුනහම එයාගේ ශාරීරික වශයෙන් වෙනස් කමක් තිබෙනවා. නමුත් චිත්ත පරම්පරාව වශයෙන් එයා එක්කෙනාමයි. ඉතිං ඔය කාරණය බුදුරජාණන්වහන්සේ එක තැනක මෙලෙස දේශනා කරනවා. ඒ තමයි ගෙවල් දෙකක් තිබෙනවා, ඒ ගෙවල් දෙකේ දොරවල් දෙක මූණට මූණ ලා තිබෙනවා. මූණට මූණ ලා තිබෙන දොරටු දෙකක් මැද ඇස් පෙනෙන්නා වූ මනුස්සයෙක් ඒ පැත්තට මූණලාගෙන සිටිනවා. එතකොට ඒ ඇස් තිබෙන මනුස්සයාට පේනවා එක ගෙයකින් කෙනෙක් අනිත් ගෙට යනවා, ඒ ගෙයින් කෙනෙක් අනිත් ගෙට යනවා. ඒ කියන්නේ එක ගෙයකින් එක්කෙනෙක් පිටවෙලා අනිත් ගෙට ඇතුල් වෙනවා දකිනවා. ආන්න ඒ වගේ බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා උන්වහන්සේගේ දිවැසට පේනවා මේ සත්වයෝ මේ ජීවිතියෙන් අයින් වෙලා, එක ගෙදරින් පිටත් වෙලා අනිත් ගෙයකට ඇතුල් වෙනවා වගේ මේ ශරීරයෙන් අයින් වෙලා වෙනත් ශරීරයකට ඇතුල් වෙන අයුරු. ඊළඟට එතැනින් අයින් වෙලා එහා පැත්තට තවත් ශරීරයකට පිවිසෙන අයුරු.

මනුස්ස ලෝකයේදී මනුස්ස ශරීරයට සම්බන්ධ වෙලා හිත පැවතුනා. ක්‍ෂණයකින් එයා මරණයට පත්උනා. ඊළඟට එයාට ඕපපාතික වූ දිව්‍යය ජීවිතියක් සම්බන්ධ වෙනවා. එතකොට මෙතැන තිබ්ච්ච විඤ්ඤාණය දැන් වැඩ කරන්නේ දිව්‍යය ශරීරයකට සම්බන්ධ වෙච්ච දිව්‍යලෝකයක. ඒක නිසා බුදුරජාණන්වහන්සේ මේ ගෙයින් අයින් වෙන එක්කෙනා වෙනත් ගේකට ඇතුළු වෙන විදිය දිවැසින් දකිනවා. ඒවගේම 'මම මේවා දැකලයි දේශනා කරන්නේ' කියලා බුදුරජාණන් වහන්සේ සඳහන් කරනවා.

මේ හේතුඵල ධර්මයන්ගේ අපිට තේරෙන්නේ නැත්තේ, තේරුම් ගන්න අමාරු ඔන්න ඔය කියන්නා වූ ගැට ගැසෙන චිත්ත ක්‍රියා කාරිත්වය වෙන තැනයි.

එක තැනක සඳහන් කරනවා **තත්ථ කතමං සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං?** කියලා. ඊයේ අපි කිව්වා **සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං** කියන්නේ මොකක්ද කියලා. ඒකෙ තිබෙනවා විඤ්ඤාණ හයක්. විස්තර කිරීම් වශයෙන් ගොඩවල් හයක් මම ඊයේ කියලා දුන්නා. අදත් පොඩි එක්කාසුවක් කරලා ඉස්සරහට අපි කථා කරමු.

විඤ්ඤාණ ගොඩවල් 6 ක් තිබෙනවා. මම ඊයේ ගොඩවල් 5 ක් කියලා දුන්නා. ඒ තමයි **චක්ඛුවිඤ්ඤාණ - සෝතවිඤ්ඤාණ - ඝාණවිඤ්ඤාණ - ජිව්හාවිඤ්ඤාණ - කායවිඤ්ඤාණ.**

විපාක සිත් වශයෙන් අපි සිත් 32 ක් දැන ගත්තා. එයින් 10 ක් චක්ඛු සෝත ආදී ද්විපඤ්ච විඤ්ඤාණ වලට අයිති වෙනවා. එතකොට ( 32 - 10 = 22 ) තව සිත් 22 ඉතුරු වෙනවා. මේ සිත් 22 ට අපි පොදු වශයෙන් කියනවා **මනෝ විඤ්ඤාණ** කියලා. මේක විස්තර කරන කොට 'මනෝධාතු' එහෙම කියලා තිබෙනවා, නමුත් පොදු වශයෙන් ගත්කල මේ සිත් 22 **මනෝ විඤ්ඤාණ** වෙනවා. මේ මනෝ විඤ්ඤාණ 22 කම විපාක. මේ විදියට ගත්තහම තේරුම් ගැනීමට පහසු කමක් තිබෙනවා.

මේවා විපාක දෙනකොට **ප්‍රතිසන්ධි** වශයෙන් සහ **ප්‍රවෘත්ති** වශයෙන් ආකාර දෙකකට විපාක දෙනවා කියලා අපි කිව්වා. ඒ කියන්නේ අවස්ථා දෙකක්. ප්‍රතිසන්ධියක් ගැටගහලා දීම වශයෙන් විඤ්ඤාණ පහළ වෙනවා. ඒ විඤ්ඤාණ පහළ වෙන්නේ නිකං නොවෙයි සංඛාර නිසයි. ඒ විදියට විඤ්ඤාණවලට ඉලිප්පෙන්න අපි කලින් සංඛාර හදලා තිබෙනවා.

ඒවාගේම අනිත් කාරණය තමයි ප්‍රවෘත්ති වශයෙන් මේ අවස්ථාවේදීත් පහළ වෙන විඤ්ඤාණ වලට **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං** කියලා කියනවා. ඒ තමයි දකින දේවල් අහන දේවල් ආඝ්‍රාණය කරන දේවල් රස වශයෙන් ස්පර්ශ වශයෙන් එන හොඳ දේවල් නරක දේවල් සියල්ලක්ම ප්‍රවෘත්ති විපාක. මේ වෙලාවේදීත් අපි කර්ම විපාකයක් විඳිනවා. ඒ කියන්නේ **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං** කියන කථාව මේ අවස්ථාවටත් යෝග්‍යයි, ක්‍රියාත්මක වෙනවා, හේතුවක ඵලයක් වශයෙන්.

අපේ ජීවිතියේ මුල් අවස්ථාවේදී පළවෙනිම පළවෙනි අවස්ථාවේදීත් ඒ කියන්නේ ප්‍රතිසන්ධි අවස්ථාවේදීත් **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං** කියන එක ප්‍රතිසන්ධි සිතට සම්බන්ධ කරලා දැන ගන්න ඕනෑ. මේ කාරණා ටික තේරෙනවා ඇති කියලා මම විස්වාස කරනවා.

අද මේ පින්වතුන්ට තව කාරණයක් කියලා දෙනවා. ඒ තමයි, මරණයයි ප්‍රතිසන්ධියයි කියන තැන අපි ගොඩක් හැසිරෙන්න ඕනෑ. ගොඩක් දැනගන්න ඕනෑ. එහෙම දැන ගත්තොත් තමයි මේක හොඳට පැහැදිලි වෙන්නේ. නැත්නම් **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං** කියලා කිව්වට තේරෙන්නේ නෑ. දන්නේ නෑ. ඒක නිසා මේක හරි ගැඹුරු තැනක්. **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං** කියන එක තේරුම් ගන්නේ නැතුව **විඤ්ඤාණ පච්චයා නාමරූපං** කියනඑක තේරුම් ගන්න බෑ.

තවත් කාරණයක් කියලා දෙන්න ඕනෑ. මේක එක තැනක පටලැවෙනවා.

ඒ තමයි සංඛාර හදන වෙලාවේ, අපි මෙහෙට එන්න කලින් ක්‍රියාත්මක වෙච්ච ප්‍රධාන බලවත් කරුණු තුනක් තිබෙනවා. ඒ තමයි **අවිද්‍යාව තණ්හාව සහ කර්ම.** අවිද්‍යාව තණ්හාව කර්ම කියන ධර්මතා තුන වැඩියෙන්ම වැඩියෙන්ම දඟලලා දඟලලා තමයි සංඛාර හැදෙන්නේ. තණ්හාව නැත්නම් කර්ම හැදෙන්නේ නෑ. කර්ම කියන ඒවා තිබුණට තණ්හාව වැඩ කරන්නේ නැත්නම් කර්ම හැදෙන්න බෑ. කර්ම හැදෙන්න නම් තැනකට ආසා කරන්න ඕනෑ. ඊළඟට තණ්හාව තිබෙනවා නමුත් කර්මය හැදෙන්නේ නැත්නම්

ඒත් වැඩක් නෑ. කර්ම හදන්න පුළුවන් ගතිය තිබෙනවා, නමුත් තණ්හා කරන්නේ නෑ. එතකොටත් සංඛාර හැදෙන්නේ නෑ.

ඒක නිසා අවිද්‍යාවයි තණ්හාවයි කර්මයි කියන තුන බලවත් විදියට වැඩ කළා අපි කර්ම හදන වෙලාවේ. ඒ තමයි අපි මල් පූජා කරන වේලාවේ - දානය දෙන වේලාවේ - බණින වේලාවේ - ගහන වෙලාවේ - රවන වේලාවේ. ඒ හැම තැනකම බලවත් උනේ **අවිද්‍යාව තණ්හාව සහ කර්මය**. කර්ම හැදීමට තණ්හාව හැම වේලේම support කළා, අවිද්‍යාවත් support කළා. ඒක නිසා කර්ම සකස් උනා. කර්ම සකස් කිරීමට තණ්හාව බලවත් උදව්වක් උනා. තණ්හාව නිසා තමයි කර්ම හැදුවේ.

දිව්‍යලෝකයක සාමාන්‍ය උසකට රත්තරන් වලින් හැදිච්ච දෙපැත්තට ජනෙල් හයිවෙච්ච තායිලන්තයේ ක්‍රමයට තිබෙන වහලයක් එක්ක ඒවාගේම බීරළු දාපු දොරකුත් එක්ක විමානයකට මම කැමති වෙනවා. හැබැයි කැමති උනාට වැඩක් නෑ, යන්න බෑ. එහෙ යන්න කර්ම නෑ. ඒක නිසා මම කරන්නේ ඒකට තණ්හා කරලා ආසා කරලා ඊට පස්සේ කර්ම හදනවා. කර්ම හදන්නේ ඒක ලැබෙන්න. ඊට පස්සේ මම අතුගානවා කුණු අයින් කරනවා, තවත් වැලි වගේ පෑගෙනවා නම් කොස්සෙනුත් අතු ගානවා, අර විමානය මට අවශ්‍යය නිසා. ඒකට ආස කරලා දැන් ඒවගේ කර්ම හදනවා. ඒ කර්ම හදන්නේ තණ්හාව නිසයි. ඊට පස්සේ ඒ විමානෙට මට පුටු ටිකක් අවශ්‍යයි. ඒක නිසා මම මෙහෙ තිබෙන පුටු වල dust එක අයින් කරනවා. තෙත රෙද්දකින් පිරිසුදු කරනවා. ඒ උනාට තවත් මදි. තවත් මට අවශ්‍ය වෙනවා දෙවි දේවතාවුන්ගෙන් වැදුම් පිදුම් ගන්න. ඒක නිසා ලොකු හාමුදුරුවෝ එනකොට පසඟ පිහිටුවලා වඳිනවා. මේ විදියට කර්ම හදනවා. මේ කර්ම හදන්නේ කුමක් නිසාද? කර්ම හදන්නේ මම විමානයට ආසයි, ලෝභයි. මේ විදියට තණ්හාව කර්මයට රුකුල් දෙනවා. මේ විදියට කර්ම හදාගත්තා.

**'සංඛාර'** වචනයෙන් කියන්නේ චේතනාවයි. කර්ම හැදීමේදී operate වෙන්නේ චේතනාවයි. දැන් පේනවා නේද කර්ම හදන්න ප්‍රධාන වශයෙන් උදව් කරපු එක්කෙනා guide කරපු එක්කෙනා තමයි තණ්හාව. නමුත් අපි මේ වෙලාවේදී තණ්හා පච්චයා විඤ්ඤාණං කියලා කියන්නේ නෑ. තණ්හා පච්චයා විඤ්ඤාණං කියලා කියන්නේ නැතුව **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං** කියලා කියනවා. ඒ සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං කියලා කියන්නේ විඤ්ඤාණ හැදෙන්න විශේෂයෙන්ම ළඟම හේතුව උනේ කර්ම මිසක තණ්හාවම නොවෙයි. තණ්හාව හේතු උනේ කර්ම හදන්නයි. දැන් තණ්හාවෙන් හදපු කර්ම ටික තිබෙනවා. කර්ම කියන්නේ සංඛාර. **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං** කියලා කියනවා උප්පත්තිය ගැන කථා කරනකොට.

('සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං' කියලා කියන තැන තිබෙන්නේත් 'කර්ම පච්චයා විඤ්ඤාණං' කියන එකමයි. ඒ කියන්නේ 'කුසල කර්ම පච්චයා විපාක විඤ්ඤාණං' කියන එක. නමුත් අපි කියන්නේ 'සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං' කියලා).

**විඤ්ඤාණය** කියලා කියන්නේ උප්පත්ති තැන. **සංඛාර** කියලා කියන්නේ හේතු වෙච්ච තැන.

දැන් තවත් තැනක් තිබෙනවා. දැන් කෙනෙක් දිව්‍ය ලෝකයට යනවා. දිව්‍ය ලෝකයට ගිහිල්ලා එහෙ ඉන්නවා. එයාට ඕපපාතික දිව්‍ය ශරීරයක් තිබෙන්නේ. ඒ ඕපපාතික දිව්‍ය ශරීරය ලබාගෙන ඒ දිව්‍ය ලෝකයේ ඉන්නකොට තවත් එහෙට එනවා දෙවි දේවතාවෝ. මගේම දිව්‍ය විමානය තිබෙන්නා වූ lane එකේ ටිකක් එහා පැත්තේ තවත් මහා ලොකු සුදුපාට විමානයක් මල් වැලුත් එක්ක හට ගන්නවා. මේ විදියට වෙනත් ලොකු පිංකම් කරපු අයට මම බෝධිය අතු ගාල අතු ගාලා ලබා ගත්තු විමානයට වඩා ලොකු ලොකු විමාන ලැබෙන කොට මට ඊර්ෂ්‍යාවක් හැදෙනවා. ඒකෙන් මම දුර්වර්ණ වෙනවා, අපාට වෙනවා. හිතේ අමාරුවක් අසන්තෝසයක් අමනාපයක් ඇතිවෙනවා. ඕපපාතිකව පහළවෙලා එහෙම ඉඳලා ඊළඟට switch එක off කරහම ලයිට් යනවා වගේ එතැනින් අතුරුදහන් වෙලා චුත වෙලා යනවා. එතකොට මම එතැනට තණ්හා කළාට එතැනට යන්න කර්ම හැදුවට මට නොතේරුම් ගතියක් තිබුණා ඒක permanent එකක් කරගන්න බෑ කියලා. ඒක තමයි නොතේරුම් කම. ඒ දන්නේ නැති කම තිබුණා. ඒක නිසා තමයි එක්තරා කාල පරිච්ඡේදයකට මම එතැනට ගියේ.

එතකොට කර්මය හදන්න තණ්හා කරන වෙලාවේ අවිද්‍යාවත් ඇවිල්ලා මහා විසාල ප්‍රත්‍යය වීමක් වෙලා තිබෙනවා. ඔය විදියට තමයි ඕක වෙන්නේ. හැබැයි දිව්‍යලෝකයේ ගිහිල්ලා ඔය කටයුතු කාරණා ටික සිද්ධ කරගෙන මම නැවත කොහේ හරි පහත තැනකට පත්වෙනවා. එතැනදී මට තේරුම් ගන්න බැරි උනා දුකක් තිබෙනවා කියලා.

දැන් බලන්න බුදුරජාණන් වහන්සේ එකතැනක දේශනා කරනවා දුක ඇතිවෙන තැන දුකට හේතුව තණ්හාව කියලා. දැන් තණ්හා කරලා තමයි දිව්‍යලෝකයේ විමානය හදාගත්තේ. නමුත් එතැන උපදින හේතුවට කියන්නේ <u>නෑ</u> තණ්හා පච්චයා විඤ්ඤාණං කියලා. **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං** කියලයි කියන්නේ. **කුසල කර්ම පච්චයා විපාක විඤ්ඤාණං** හරි **අකුසල කර්ම පච්චයා විපාක විඤ්ඤාණං** කියලා තමයි කියන්නේ.

නමුත් දුක්ඛ සත්‍යය දේශනා කරන වෙලාවේදී අකුසල කර්ම පච්චයා අකුසල විපාක විඤ්ඤාණං කියන්නේ නැතුව **'තණ්හාව නිසා දුක ඇති උනා'** කියලා කියනවා. ඒක නිසා මේක පටලවා ගන්න හොඳ නෑ.

- තණ්හාව නිසා දුක ඇතිවෙනවා කියලා කියන්නේ චතුරාර්ය සත්‍යය ගැන කියන තැන.
- සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං කියලා කියන්නේ පටිච්චසමුප්පාදය දේශනා කරන තැන.

ඒක නිසා පටිච්චසමුප්පාදය දේශනා ක්‍රමයයි චතුරාර්ය සත්‍යය දේසනා ක්‍රමයයි කියන්නේ ධර්ම දේශනා ක්‍රම දෙකක්. ඔය වෙනස තේරුම් ගන්න ඕනෑ.

කෙටියෙන් හේතු ඵල ධර්ම දේශනා කරපු ක්‍රමය තමයි 'දුක්ඛ' 'සමුදය' 'නිරෝධය' 'මාර්ගය' කියලා **චතුරාර්ය සත්‍යය** ධර්මයන් මුල් කරගෙන කළ දේශනාව. හොඳ බුද්ධියක් හොඳ ඥානයක් හොඳට පෙර පිං තිබෙන අයට තමයි මේ චතුරාර්ය සත්‍යය ධර්මයන් මුල් කරගෙන දේශනාව කරන්නේ.

ඒ චතුරාර්ය සත්‍යය ධර්ම විග්‍රහයට තිබෙනවා කරුණු 4 ක් දුක්ඛ - සමුදය - නිරෝධය - මාර්ගය කියලා. නමුත් හේතු ඵල ධර්මයන් විග්‍රය තැන කරන පටිච්චසමුප්පාදයේ තිබෙනවා 1) අවිජ්ජා 2) සඞ්ඛාරා 3) විඤ්ඤාණ 4) නාමරූප 5) සළායතන 6) ඵස්ස 7) වේදනා 8) තණ්හා 9) උපාදාන 10) භව 11) ජාති 12) ජරාමරණ කියලා 12 ක් තිබෙනවා. මෙතැනදී දේශනා කරන්නේ විස්තරාත්මක ක්‍රමයකට. ඒක නිසා **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං** කියන තැන කියන්නේ කර්ම සම්පාදනයයි, ඒකෙන් හට ගත්ත නාම ධර්ම වශයෙන්.

'දුක්ඛ' 'සමුදය' වශයෙන් කියවෙන තැන දේශනා කරන්නේ චතුරාර්ය සත්‍යය ධර්මයන් විස්තර කරන තැන. මේ අවස්ථා දෙක පටලවා ගන්නේ නැතුව අපි අවබෝධ කරගත යුතුයි.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස චුතියයි ප්‍රතිසන්ධියයි අතර කාල සීමාවක් තිබෙනවාද?

<u>පිළිතුර</u> - චුති සිතේ සිට ප්‍රතිසන්ධි සිත අතරතුර කිසිම කාල වේලාවක් නෑ. චිත්තක්ෂණ එකයි කියලා කියන්න පුළුවන්.

සමහර කථා තිබෙනවා, ප්‍රතිසන්ධියක් ගන්නේ නැතුව අන්තරාභවයක ඉන්නවා කියලා. එහෙම භවයක් තිබෙනවා නම් ඒකත් උප්පත්තියක් ලබාපු ජීවිතියක්. ප්‍රතිසන්ධියක් හටගෙන තිබෙන්නා වූ එක්තරා විදියක ජීවිත ස්වභාවයක්.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස අපි පිං දෙනකොට ඒ අයට ගන්න පුලුවන්ද?

<u>පිළිතුර</u> - සමහර අයට පුළුවන්.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන් වහන්ස ඔබවහන්සේ දේශනා කළා නැවත උප්පත්තියකට යන කොට මෙහෙ අතහැරලා දාල යනදේකුත් තිබෙනවා, අරගෙන යන දේකුත් තිබෙනවා කියලා. එතකොට සාති භික්ෂුව එකම විඤ්ඤාණයක් යනවා කියලා ගත්තු එකයි මේ කියන කථාවෙයි වෙනස පැහැදිලි කරලා දෙන්න ස්වාමීන්වහන්ස.


<u>පිළිතුර</u> - එකම හිතක් උනානම් මෙතැන චුති සිතයි අනිත් තැන හටගන්න ප්‍රතිසන්ධි සිතයි කියන දෙකම එක වෙන්න ඕනෑ. එහෙම නම් අපි කර්ම කරන හිතයි විපාක විඳින සිතයි දෙකම එකක් වෙන්න ඕනෑ. බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ චිතක්ෂණයෙන් චිත්තක්ෂණයට වෙනස් වෙවී යන නිසා කිසිම තැනකදී වෙනස් නොවෙන්නා වූ සිතක්, ඒකාකාරී සිතක් පවතින්නේ නෑ කියලා. දැන් මේ ජීවිතයේදී මේ ශරීරය ආධාර කරගෙන මේ ඇස් ආධාර කරගෙන අපිට රූප පේනවා. දැන් මේ රූප පේන්නේ අපිට දැනට ලැබී තිබෙන කර්මයෙන් හදලා දීපු ඇස් නිසා. ඒවගේම කර්මයෙන් හදලා දීපු නාසය - කන - දිව - ශරීරය නිසා තමයි ගෝචර රූප ග්‍රහණය වෙන්නේ. නමුත් මේ ශරීරය අයින් වෙලා ගිය ගමන්ම මේකට අනුව වැඩ කරන සිත් ඔක්කොම වෙනස් වෙලා යනවා. ඊට පස්සේ දිව්‍ය ශරීරකට ගිය ගමන් මේ මනුස්ස ලෝකයේ ඇසකින් රූප බලනවා වගේ නොවෙයි දිව්‍ය ඇසකට රූප පේන්නෙ. දිව්‍ය

කනකට සද්දයක් ඇහෙන්නේ. අපිට පේනවට වඩා සිය දහස් ගුණයකින් සියුම් වෙච්ච රූප පවා හොඳට තේරෙනවා ඇහෙනවා පැහැදිලි වෙනවා.

සාති භික්ෂුව ගත්ත දෘෂ්ඨිය තමයි වෙනස් වෙන්නේ නැති ඒකාකාරී යම්කිසි විඤ්ඤාණය ශක්තියක් මේ ජීවිතියෙන් අනිත් ජීවිතියට සංක්‍රමණය කරනවා කියලා. එහෙම වෙනස් වෙන්නේ නැති දෙයක් තිබෙනවා කියලා ගත්තහම සාශ්වත දෘෂ්ඨියට යනවා. එයා ඊට පස්සේ ආත්ම ග්‍රහණය කරගන්නවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ මේ සිත මේ ඉන්නකොටත් වෙනස් වෙවී වෙනස් වෙවී යනවා කියලා. ඒක සන්තතියක් වශයෙන්, පේළියක් වශයෙන් continue වෙන එකක් උනාට එකම සිතක් වෙනස් නොවී එහාට යනවා නොවෙයි. අන්න ඒකයි තිබෙන වෙනස් කම.

ප්‍රශ්නය - ස්වාමීන්වහන්ස සංඛාර හදන අවස්ථා හරියට තේරුණේ නෑ.

පිළිතුර - එතැන වෙන්නේ මෙහෙමයි. කර්ම හැදීමට තණ්හාවගෙන් උදව්වක් එනවා. අවිජ්ජාවත් උදව් කරනවා. මේ කර්ම කියන එක අපි වචන තුනකින් පාවිච්චි කරනවා. කර්ම කියලා කියන්නේ චේතනාව. කර්ම හදන්නේ චේතනාවෙන්. චේතනාවේ තමයි අභිසංස්ඛරණ ගතිය තිබෙන්නේ. ඒ කියන්නේ යම් කිසි දෙයක් සකස් කරන operate කරන develop කරන ගතිය තිබෙන්නේ චේතනාවේ. අපි සමහර වේලාවට චේතනාවට කර්මය කියලත් කියනවා. සමහර විට සංඛාර කියලත් කියනවා.




'සංඛාර' කියන එකයි 'චේතනාව' කියන එකයි 'කර්ම' කියන එකයි තුනම සමානයි. සමහර වෙලාවට මම **චේතනාව** කියන වචනය පාවිච්චි කරනවා. සමහර වෙලාවට කර්මය කියන වචනය පාවිච්චි කරනවා. ඒක නිසා තණ්හා පච්චයා සංඛාර - තණ්හා පච්චයා චේතනා - තණ්හා පච්චයා කර්ම කියලත් කියන්න පුළුවන්. තුනම එකයි.

ඒවගේම **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං** කියන තැන තේරෙන්නේ නැත්නම් අපිට **සංඛාර** කියන තැනට **පුඤ්ඤාභිසංඛාර** කියල හෝ **කුසල චේතනා** කියලා හෝ **කුසල කර්ම** කියලා හෝ දාන්න පුළුවන්.

උදාහරණ

- පුඤ්ඤාභි සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං.
- අපුඤ්ඤාභි සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං.
- කුසල චේතනා පච්චයා විඤ්ඤාණං.
- කුසල කර්ම පච්චයා විඤ්ඤාණං.

මේ තුනේ තිබෙන්නේ භාෂාවේ වෙනස පමණයි. අර්ථය සමානයි. පටිච්චසමුප්පාදයේදී ගන්නේ **'සංඛාර'** කියන වචනයයි. සංඛාර කියන වචනය තුල තිබෙන ගුණය 'චේතනාවයි'.

ඒවගේම අපිට **විඤ්ඤාණං** කියන තැනටත් ඒ වචනය තවත් පැහැදිලි වීම පිණිස 'පටිසන්ධි විපාක විඤ්ඤාණං' කියා හෝ 'ප්‍රවෘත්ති විපාක විඤ්ඤාණං' කියා හෝ දා ගන්න පුළුවන්. ඒකට හේතුව, විඤ්ඤාණං කියලා කියන්නේ සංඛාර වල බලයෙන් පහළ වෙන විපාක නිසා.

උදාහරණ

- **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං** = පුඤ්ඤාභිසඞ්ඛාර පච්චයා පටිසන්ධි විපාක විඤ්ඤාණං
- **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං** = පුඤ්ඤාභිසඞ්ඛාර පච්චයා ප්‍රවෘත්ති විපාක විඤ්ඤාණං

- **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං** = අපුඤ්ඤාභිසඞ්ඛාර පච්චයා පටිසන්ධි විපාක විඤ්ඤාණං
- **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං** = අපුඤ්ඤාභිසඞ්ඛාර පච්චයා ප්‍රවෘත්ති විපාක විඤ්ඤාණං

ධර්මය සමාජගත කරන දේශනා ක්‍රම දෙකක් තිබෙනවා. එයින් එක ක්‍රමයක් තමයි සම්මුතියේ පිහිටා සම්මුති වචනයෙන්, කෙනෙකුට තේරුම් ගන්න පුළුවන් එදිනෙදා ව්‍යවහාර කරන වචනයෙන් දේශනා කරනවා. අනිත් ක්‍රමය තමයි සමාජයේ වැරදි වශයෙන් පිළිගන්න 'බණිනවා' 'ගහනවා' 'දොස් කියනවා' වැනි දේවල් කරනකොට ඒ අනුව හිත ක්‍රියාත්මක වෙන්නේ කොහොමද කියලා තව විදියකට කියලා දෙනවා.

දැන් අපි ලෙඩකට බෙහෙත් කරනකොට ඒ ලෙඩේ හඳුන්වන ක්‍රම දෙකක් තිබෙනවා. අපිට බඩේ දැවිල්ලක් හැදුනහම ඒකට කියනවා බඩ දනවා කියලා. ඒක ලෙඩක්. සමහර ඒවා බඩේ දැවිල්ලට හොඳයි කියලා කියනවා. ඒ සම්මුති වචනයක්. බඩේ දැවිල්ල කියන එක අපිට තේරෙනවා. මේ බඩේ දැවිල්ල කියන එක සමහර තැන් වලදී කියලා දෙන්නේ වෙනත් ක්‍රමයකට. එතකොට කියනවා acid කියලා කියනවා. නැත්නම් Gastritis කියලා කියනවා. එතැනදී acid වල ස්වභාවය අරගෙන කියලා දෙනවා.


ඒවගේ සමාජයට යමක් කියනකොට සම්මුති වචනයෙන් කියනවා, ඒ අනුව ඇතුලතින් ක්‍රියාත්මක වෙන සිතේ ස්වභාවය අනුවත් කියනවා.

දැන් බලමු අකුසල් සිත්

1) **සෝමනස්ස සහගත දෘෂ්ඨිගත සම්ප්‍රයුක්ත අසංඛාරික සිත** - මේ සිත කර්ම සිතක්. මේ සිතෙන් කෙරෙන එක දෙයක් තමයි සොරකම් කිරීම. සොරකම් කිරීම ලෝභ මූලයි.

ඒ සොරකම් කරන වෙලාවට අපි ලෝකයට කියනවා සොරකම් කරනවා කියලා. නමුත් ඇතුලතින් **සෝමනස්ස සහගත දෘෂ්ඨිගත සම්ප්‍රයුක්ත අසංඛාරික සිත** ක්‍රියාත්මක වෙනවා.

දැන් සොරකමක් කරලා කර්මයක් හැදුවා. ඒක අකුසලයි. මේ කර්මය හදන්න උදව් උනා 'අවිද්‍යාව' 'තණ්හාව' සහ 'චේතනාව'. දැන් කර්මය හැදිලා ඉවරයි.




**සෝමනස්ස සහගත දෘෂ්ඨිගත සම්ප්‍රයුක්ත අසංඛාරික**
පළවෙනි අකුසල් සිතෙන් කර්ම රැස් කළා.

මේ අකුසල සංඛාර වලට අපුඤ්ඤාභිසංඛාර කියලත් කියනවා. අකුසල සිත කියලත් කියනවා. (අකුසල සංඛාර = අපුඤ්ඤාභිසංඛාර = අකුසල සිත)

2) සෝමනස්ස සහගත දෘෂ්ඨිගත සම්ප්‍රයුක්ත සසංඛාරික සිත





**සෝමනස්ස සහගත දෘෂ්ඨිගත සම්ප්‍රයුක්ත සසංඛාරික**
දෙවෙනි අකුසල් සිතෙන් කර්ම රැස් කළා.

දැන් මේ දෙන්නම අකුසල් කරලා තිබෙනවා. මේ අකුසල් සිත් දෙකේ තිබෙනවා හයිය ගති දෙකක්. ඒ තමයි **ප්‍රතිසන්ධියක්** දීමේ හැකියාව සහ **ප්‍රවෘත්ති විපාක** දීමේ හැකියාවත්

තිබෙනවා. අකුසලයක් කරනකොට අපි හිතනවා ඒ සිතෙන් ප්‍රතිසන්ධිය ලබා දුන්නේ නැත්නම් ඒක ඉවරයි කියලා. නමුත් එහෙම වෙන්නේ නෑ, වෙන විපාකයකින් ප්‍රතිසන්ධිය ලබාගත් කෙනාට ප්‍රවෘත්ති වශයෙන් විපාක ලබා දෙවනවා. (ප්‍රවෘත්ති විපාක කියන්නේ කොහේ හරි ඉපදුනාට පස්සේ ලැබෙන විපාක)

1) අපි හිතමු **සෝමනස්ස සහගත දෘෂ්ඨිගත සම්ප්‍රයුක්ත අසංඛාරික** පළවෙනි අකුසල් සිතින් සොරකම් කරපු කෙනා මැරෙනවා කියලා.




මේ කෙනා අවුරුදු 50 කට පෙර අපුඤ්ඤාභිසංඛාර රැස් කළත් ඒ අපුඤ්ඤාභිසංඛාර වල තිබෙනවා ගතියක්, එයා චුතියට යන අවස්ථාවේදී ඉස්සරහට ඇවිල්ලා ප්‍රතිසන්ධියක් ලබා දෙවන.

ඒ ප්‍රතිසන්ධිය ලබා දෙන්නේ **'අහේතුක අකුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ සිත'**. මේ සිතෙන් එයා නරකාදියේ ඉපදෙනවා. මෙයා ඉස්සෙල්ලා හිටියේ මනුස්ස ලෝකයේ.

ඒක නිසා එතැනදී **සංඛාරපච්චයා විඤ්ඤාණං = අකුසල සංඛාර පච්චයා අකුසල විපාක උපෙක්ඛා සහගත පටිසන්ධි විඤ්ඤාණං.**

2) ඊළඟට **සෝමනස්ස සහගත දෘෂ්ඨිගත සම්ප්‍රයුක්ත සසංඛාරික** සිතෙන් අකුසල් කරපු කෙනත් මැරෙනවා. එයා ගිහිල්ලා ඉපදෙනවා තිරිසන් ලෝකයේ.




**(චුතිය)**

**අකුසල සංඛාර පච්චයා** →

**(තිරිසන් ලෝකයේ ප්‍රතිසන්ධිය ගැනීම)**

**අකුසල විපාක උපෙක්ඛා සහගත පටිසන්ධි විඤ්ඤාණං**

**පටිසන්ධි විඤ්ඤාණය = අහේතුක අකුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ සිත.**

මෙවැනි අහේතුක අකුසල විපාක සිත් තිබෙනවා හතක්. (07)

1) **උපෙක්ඛා සහගත චක්ඛු විඤ්ඤාණය.**
2) **උපෙක්ඛා සහගත සෝත විඤ්ඤාණය.**
3) **උපෙක්ඛා සහගත ඝාණ විඤ්ඤාණය.**
4) **උපෙක්ඛා සහගත ජිව්හා විඤ්ඤාණය.**
5) **දුක්ඛ සහගත කාය විඤ්ඤාණය.**
6) **උපෙක්ඛා සහගත සම්පටිච්ඡනය.**
7) **උපෙක්ඛා සහගත සන්තීරණය.**

} අකුසල කර්ම වල විපාක වශයෙන් **ලැබෙන සිත්.**

අකුසල් කරහම ඒවායේ විපාක වශයෙන් ලැබෙන ඉහත සඳහන් සිත් හතෙන් අවසාන සිත වන **උපෙක්ඛා සහගත සන්තීරණ** සිතෙන් තමයි පෙරේත ලෝකයට නරකාදියට අපිව ගැටගහලා දෙන්නේ. මේ සිත් හැදෙන්නේ නෑ, පෙර අකුසල් කරලා තිබුණේ නැත්නම්. හැම අකුසල සිතකම තිබෙනවා සන්තීරණ සිතක් හදන ගතිය.

අපි හිතමු කාටහරි කෙනෙකුට තමන්ට අයිති නැති දෙයක් හොරකම් කරන්න හිතක් පහළ උනා කියලා. එයා ඒ සිතින් ඒ හොරකම කරන කොටම එයාට පහළවෙන්නේ **සෝමනස්ස සහගත දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත අසංඛාරික සිත**. ඒ වේලාවේම **අහේතුක උපෙක්ඛා සහගත අකුසල විපාක සන්තීරණ** සිතක් හදන්න පුළුවන් ගතියක් එයා තුල හැදෙනවා.

- **සෝමනස්ස සහගත දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත අසංඛාරික** සිත තමයි කර්ම විඤ්ඤාණය.
- **අහේතුක අකුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ** සිත තමයි විපාක විඤ්ඤාණය.

අපි අකුසල සිතකින් යමක් කරනවා කියල කියන්නෙම සන්තීරණ සිතක් හැදෙන්න සංඛාර සකස් කළා කියන එකයි.

අපි හිතමු කෙනෙක් සුනඛයෙක් වෙලා දුගතියේ ඉපදුනා කියලා. ඒ බල්ලා උපදිනකොට එයාගේ ප්‍රතිසන්ධි විඤ්ඤාණය **'අහේතුක අකුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ'** සිතයි. ඔය බල්ලෝ හරක් නරි හිවල්ලු අලි කොටි වගේ තිරිසන් සතුන් ඔක්කොම ඉපදිලා ඉන්නේ ඒ හිතෙන්. ඒ හිත හදන්න හයිය තිබෙන්නේ අකුසල් සිත්වල.

**'අහේතුක අකුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ'** හැර තවත් **තිබෙනවා උපෙක්ඛා සහගත චක්ඛු විඤ්ඤාණය - උපෙක්ඛා සහගත සෝත විඤ්ඤාණය - උපෙක්ඛා සහගත ඝාණ විඤ්ඤාණය - උපෙක්ඛා සහගත ජිව්හා විඤ්ඤාණය - දුක්ඛ සහගත කාය විඤ්ඤාණය - උපෙක්ඛා සහගත සම්පටිච්ඡනය** කියලා අහේතුක විපාක සිත් හයක්.

දැන් බලු ශරීරයක් ඇතුව තිරිසන් ලෝකයේ **'අහේතුක අකුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ'** සිතෙන් ඉපදුනාට පස්සේ එයාට තවත් කර්ම විපාක ලැබෙනවා. මේ බල්ලා හොරෙන් කෑමක් කාපු නිසා කෙනෙක් විසාල පොල්ලකින් ගහන්න එනවා. මේක දැක්කහම බල්ලාට සන්තෝසයක් ඇතිවෙන්නේ නෑ. ඒක තමයි එයාට ලැබෙන **අකුසල විපාක චකබු විඤ්ඤාණය.** ඒක අහේතුක අකුසල **විපාක** සිතක්.

ඊළඟට ඒ බල්ලාට සැර වචන පාවිච්චි කරලා කෙනෙක් බණිනවා. ඒ සද්ද නිසා බල්ලාට පහළවෙන්නේ **අකුසල විපාක සෝත විඤ්ඤාණ.** ඒවා ලැබෙන්නේ පෙර රැස් කළ අකුසල සංඛාර නිසා.

පෙර රැස්කළ මෙම අකුසල සංඛාර වලට **ප්‍රතිසන්ධියක්** ලබා දෙන්නත් පුළුවන්. **ප්‍රවෘත්ති විපාක** ලබලා දෙන්නත් පුළුවන්.

ඊළඟට මේ බල්ලා බයෙන් ගේ අස්සට රිංගලා එළියට එන්නේ නැති අවස්ථාවකදී කෙනෙක් ඒ බල්ලා එළියට ගන්න දුං කබලක් අරගෙන ඒකට මිරිස්කුඩු දානවා. නැත්නම් මොකක් හරි ගෑස් එකක් දානවා. ඒ මිරිස් සුවඳ හොඳ එකක් නොවෙයි. ඒක තමයි බල්ලාට පහළ වෙන **අකුසල විපාක ඝාණ විඤ්ඤාණ.** ඒකත් ප්‍රවෘත්ති විපාකයක්.

ඊළඟට ඒ බල්ලාට දෙනවා නීරස කෑමක්. එයා ඒක කනවා. එතකොට ඇතිවෙන්නේ **අකුසල විපාක ජිව්හා විඤ්ඤාණයක්.** ඒකත් ප්‍රවෘත්ති විපාකයක් = **සංඛාර පච්චයා විඤ්ඤාණං.**

ඊළඟට මේ බල්ලාට කවුරුහරි අල්ලගෙන ගහනවා. එතකොට ඇතිවෙන්නේ **දුක්ඛ සහගත කාය විඤ්ඤාණ.** ඒකත් ප්‍රවෘත්ති විපාකයක් **= සංඛාරපච්චයා විඤ්ඤාණං.**

ඊළඟට තිබෙනවා **උපෙක්ඛා සහගත සම්පටිච්ඡනය.** ඒකත් විපාක විඤ්ඤාණයක්.

දැන් නැවතත් අපි බලමු මේ අකුසල් විපාක සිත් අපිට තේරෙන ආකාරයට:

1) අපුඤ්ඤාභි **සංඛාර පච්චයා** පටිසන්ධි විපාක **විඤ්ඤාණං** = (අහේතුක අකුසල විපාක **උපෙක්ඛා සහගත සන්තීරණ සිත).**
2) අපුඤ්ඤාභි **සංඛාර පච්චයා** ප්‍රවෘත්ති විපාක චක්ඛු **විඤ්ඤාණං.**
3) අපුඤ්ඤාභි **සංඛාර පච්චයා** ප්‍රවෘත්ති විපාක සෝත **විඤ්ඤාණං.**
4) අපුඤ්ඤාභි **සංඛාර පච්චයා** ප්‍රවෘත්ති විපාක ඝාණ **විඤ්ඤාණං.**
5) අපුඤ්ඤාභි **සංඛාර පච්චයා** ප්‍රවෘත්ති විපාක ජිව්හා **විඤ්ඤාණං.**
6) අපුඤ්ඤාභි **සංඛාර පච්චයා** ප්‍රවෘත්ති විපාක දුක්ඛ සහගත කාය **විඤ්ඤාණං.**
7) අපුඤ්ඤාභි **සංඛාර පච්චයා** ප්‍රවෘත්ති විපාක සම්පටිච්ඡන **සිත.**

මේ **සංඛාර පච්චයා විඤ්ඤාණං** කියන තැන **පටිසන්ධි විපාකත්** තිබෙනවා **ප්‍රවෘත්ති විපාකත්** තිබෙනවා. මේ විදියට තමයි **සංඛාර පච්චයා විඤ්ඤාණං** කියන තැන තේරුම් ගන්නේ.

ඊළඟට ද්වේශ සහගත සිත් 2

1) **දෝමනස්ස සහගත පටිඝ සම්ප්‍රයුක්ත අසංඛාරික සිත**
2) **දෝමනස්ස සහගත පටිඝ සම්ප්‍රයුක්ත සසංඛාරික සිත**

අපි හිතමු කෙනෙක් මැරෙන්න මාසයකට විතර කලින් **දෝමනස්ස සහගත පටිඝ සම්ප්‍රයුක්ත අසංඛාරික** සිතෙන් විසාල මිනිස් ඝාතනයක් කරනවා කියලා. ඒ මිනිස් ඝාතන කරන වෙලාවේදීම මේ අකුසල් සිත් දෙක පහළ වෙනවා. අපි ‘මිනිස් ඝාතන’ ‘සත්ව ඝාතන’ කියලා සමාජ ගත කළාට ඇත්තටම වෙන්නේ ද්වේශ සහගත සිත් පහළ වීමයි. ඒ වෙලාවේදීම අකුසල විපාක ගෙන දෙන ශක්තියක් ඇතුලේ හැදෙනවා. ඊළඟට මෙයා මැරිලා ගිහිල්ලා උපදිනවා නරකාදියේ. නරකාදියේ ඉපදෙනකොට මෙයාට ප්‍රතිසන්ධි සිත වශයෙන් පහළ වෙන්නේ **අහේතුක අකුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ සිත.**




**(චුතිය)**

අකුසල සංඛාර පච්චයා →

**(නරකාදියේ ප්‍රතිසන්ධිය ලැබීම)**

අකුසල විපාක උපෙක්ඛා සහගත පටිසන්ධි විඤ්ඤාණං

පටිසන්ධි සිත = අහේතුක අකුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ සිත

දැන් මෙයා **අහේතුක අකුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ** සිතෙන් නරකාදියේ ප්‍රතිසන්ධි ගත්තට පස්සේ තවත් විපාක් සිත් 6 ක් තිබෙනවා ප්‍රවෘත්ති වශයෙන් විපාක දෙන්න.

නරකාදියේදී මෙයාට මහා විසාල භයානක ගිණිදැල් පේනවා. ඒ තමයි **උපෙක්ඛා සහගත අකුසල විපාක චක්ඛු විඤ්ඤාණ.** මහා රෞද්‍ර ශබ්ද ඇහෙනවා. එවිට **අකුසල විපාක සෝත විඤ්ඤාණ** පහළ වෙනවා. (නරකාදියේ ඝාණ විඤ්ඤාණ තිබෙනවා කියලත් කියනවා නැතෙයි කියලත් කියනවා). කෑමක් බීමක් නැති නිසා ජිව්හා විඤ්ඤාණ නෑ. නමුත් වැඩියෙන්ම ඇති වෙන්නේ **දුක්ඛ සහගත කාය විඤ්ඤාණ,** දැවෙනවා, පිච්චෙනවා. **දුක්ඛ සහගත කාය විඤ්ඤාණ** හරි වැඩියි. මේ **දුක්ඛ සහගත කාය විඤ්ඤාණ = ප්‍රවෘත්ති විපාක.** මෙන්න මේ කාරණය තේරුම් ගන්න. එනම් ප්‍රතිසන්ධිය කුමක්ද ප්‍රවෘත්තිය කුමක්ද කියලා දැන ගන්න.

**දෝමනස්ස සහගත පටිඝ සම්ප්‍රයුක්ත අසංඛාරික සිත - දෝමනස්ස සහගත පටිඝ සම්ප්‍රයුක්ත සසංඛාරික සිත** යන සිත් 'කර්ම සිත්'. ඒ සිත්වල චේතනාව බලවත්.

**උපෙක්ඛා සහගත චක්ඛු විඤ්ඤාණය - උපෙක්ඛා සහගත සෝත විඤ්ඤාණය - උපෙක්ඛා සහගත ඝාණ විඤ්ඤාණය - උපෙක්ඛා සහගත ජිව්හා විඤ්ඤාණය - දුක්ඛ සහගත කාය විඤ්ඤාණය - උපෙක්ඛා සහගත සම්පටිච්ඡනය - උපෙක්ඛා සහගත සන්තීරණය** යන සිත් කර්ම සිත් නොවෙයි. ඒවා විපාක සිත්. **සංඛාර පච්චයා විඤ්ඤාණං** කියලා කියන්නේ මෙන්න මේ සිත් වලට.

ප්‍රශ්නය - ස්වාමීන්වහන්ස සම්පටිච්ඡන සිතෙන් කෙරෙන් යම්කිසි විශේෂ කාර්යක් තිබෙනවද?

පිළිතුර - අපි යම් කිසි දෙයක් දකින වෙලාවට ඒක දැන ගන්න සිත තමයි චක්ඛු විඤ්ඤාණය. ඒ චක්ඛු විඤ්ඤාණය ඉවර වෙනකොටම ඒකේ replica එක වද්දාගන්න හිත තමයි සම්පටිච්ඡන සිත.

ප්‍රශ්නය - ස්වාමීන්වහන්ස කෙනෙක් අකුසලයක් කරන්න ඉස්සෙල්ලා ඒක plan කරනකොටත් අකුසල සංඛාර සකස් වෙනවද?

පිළිතුර - ඔව්, එයා මාසයක් තිස්සේ plan කළානම් එතකොට ප්‍රතිසන්ධි විපාක සහ ප්‍රවෘත්ති විපාක ගෙන දීමේ ශක්තිය තිබෙන කර්ම විශාල ප්‍රමණයක් ඇතිවෙනවා.

ප්‍රශ්නය - ස්වාමීන්වහන්ස ඔය සිත් වීථී වල යෙදෙන්නේ නැත්ද?

පිළිතුර - යෙදෙනවා, වීථියකින් තොරව මේ සිත් ඇතිවෙන්නේ නෑ.

**ප්‍රශ්නය** - ස්වාමීන්වහන්ස මේ විපාක චිත්ත වීථියක ලියන්නේ කොහොමද?

<u>පිළිතුර</u> - භවංග - භවංග චලනය - භවංග උපච්ඡේදය - පඤ්චද්වාරාවජ්ජනය (මෙය ක්‍රියා සිතක්) - චක්ඛු විඤ්ඤාණය - සම්පටිච්ඡනය - *සන්තීරණය - වොත්ථපනය - ජවන - ජවන - ජවන - ජවන - ජවන - ජවන - ජවන - තදාරම්මණ - තදාරම්මණ.

*මේ සන්තීරණ සිත් ප්‍රතිසන්ධි විපාකත් ගෙන දෙනවා ප්‍රවෘත්ති විපාකත් ගෙන දෙනවා. අනිත් සිත් වල තිබෙන්නේ ප්‍රවෘත්ති විතරයි. අපි හිතාගෙන ඉන්නවා සන්තීරණ සිත ප්‍රතිසන්ධිය ලබා දුන්නහම ඉවරයි කියලා. එහෙම වෙන්නේ නෑ. චිත්ත වීථියක යනකොට **චක්ඛු විඤ්ඤාණයයි - සම්පටිච්ඡනයයි - සන්තීරණයයි** කියන තුනම ඇතිවෙනවා, ඊට පස්සේ තමයි **වොත්ථපන** ඇවිල්ලා ජවන් වැඩ කරන්නේ.

අපි **සංඛාර පච්චයා විඤ්ඤාණං** කියලා කියනකොට ඔය විදියට තමයි තේරුම් ගන්න ඕනෑ. අපි පිං කමක් කළහමත් ඔය විදියට තමයි තේරුම් ගන්න ඕනෑ.


එතකොට වෙන්නේ **පුඤ්ඤාභිසංඛාර පච්චයා විපාක විඤ්ඤාණං**. කුසල පැත්තට කථා කරනකොට තිබෙනවා විපාක සිත් 16ක්. (සහේතුක විපාක 8 + අහේතුක 8 = 16)

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස බල්ලෝ වෙලා ඉපදෙන්නේ මානය තිබුණ අය කියලා කියනවා. එතකොට ඒක කොහොමද මේකට ආදේශ කරන්නේ?

<u>ප්‍රශ්නය</u> - ඔය සමහර මිනිස්සු ඉන්නවා කථා කරන්නේ නැතුව මාන්නයෙන් ඉන්න. එතකොට අකුසල් හැදෙනවා. ඒ අය මාන්නයෙන් අනිත් අයට ගරහා කරනකොට තිරිසන් ලෝකයට ගෙනියන්න පුළුවන් කර්ම හැදෙනවා. ඒවා කරන්නේ ලෝභ මූල සිත් වලින්. එතකොට අකුසල් හැදෙනවා. ලෝභ මූල සිත්වල තිබෙනවා මාන්නය වැඩ කරන සිත්.

හොඳයි එහෙනම් සැම දෙනාටම ධර්ම අවබෝධය නිර්වාණය අවබෝධය වේවා! කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!



ඉහත සඳහන් ධර්ම දේශනාව අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.